<u>**ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය උත්සවය-2026**</u>

<u>**නිර්මාණ ඉදිපත් කරන ලෙස කරන දැන්වීම**</u>

සාහිත්‍ය හා කියවීම් මාසය මුල් කරගෙන ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය උළෙල 2026 සඳහා නිර්මාණ ඉදිරිපත් කරන ලෙස ඌව පළාත්වාසි සාහිත්‍ය හිතැති පුරවැසියන් හා සිසු දරු දැරියන් ඇතුළු සියලු දෙනා වෙත මෙයින් ගෞරවයෙන් ඇරැයුම් කර සිටිනු ලැබේ.

පාසල් මට්ටමේ අංශ සඳහා පදක්කම් හා සහතික පත් පිරිනමන අතර විවෘත අංශය සඳහා මුදල් ත්‍යාගයක්, සම්මාන හා කුසලතා සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ.

**සාහිත්‍ය නිර්මාණ තරග අංශ**

| | තරග අංශය | පාසල් අංශය | | විවෘත අංශය |
|---|---|---|---|---|
| | | ශ්‍රේණි 06 - 08 | ශ්‍රේණි 09 - 13 | |
| 01 | කාව්‍ය රචනා | | ☑ | ☑ |
| 02 | ගීත රචනා | | ☑ | ☑ |
| 03 | කෙටි කතා | | ☑ | ☑ |
| 04 | විද්‍යා ප්‍රබන්ධ | | ☑ | ☑ |
| 05 | කෙටි නාට්‍ය - අත්පිටපත් | | ☑ | ☑ |
| 06 | චිත්‍ර | ☑ | ☑ | - |
| 07 | පරිවර්තන | | - | ☑ |
| 08 | සාහිත්‍ය පිළිබඳ ශාස්ත්‍රීය ග්‍රන්ථ | | - | ☑ |
| 09 | නවකතා - අත්පිටපත් පමණි | | - | ☑ |
| 10 | ළමා කතා | | - | ☑ |
| 11 | ඡායාරූප -2 වෘත්තීය කැමරා මගින් | | ☑ | ☑ |

**තරග අංශ** -

- **පාසල් අංශය -** 09 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහාත් 06 ශ්‍රේණිය සිට 08 ශ්‍රේණිය දක්වා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට චිත්‍ර තරග අංශය සඳහා පමණක් නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.
- **විවෘත අංශය -** ඌව පළාතේ ස්ථිර පදිංචි ඕනෑම අයෙකු සඳහා විවෘතය. විවෘත අංශය සඳහා අවශ්‍ය නම් පාසල් සිසුන්හටද සහභාගි විය හැකිය. එවිට විවෘත අංශයේ අයදුම්පතක් මගින් නිර්මාණ ඉදිරිපත් කළ යුතුය.

**භාෂා මාධ්‍ය** - සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් සියලුම තරග වෙන වෙනම පැවැත්වේ.

<u>**පොදු තරග කොන්දේසි හා විස්තර**</u>

★ මෙම තරගය සඳහා සහභාගි විය හැක්කේ ඌව පළාතේ ස්ථිර පදිංචිකරුවන්ට පමණි.

★ ඉදිරිපත් කරනු ලැබූ නිර්මාණ ආපසු ලබා දෙනු නොලැබේ. අවසන් වටය සඳහා සුදුසුකම් ලබන නිර්මාණකරුවන් සඳහා ලේඛකත්ව පුහුණු වැඩමුළුවක් පැවැත්වේ. ජයග්‍රහණය කරනු ලබන නිර්මාණ පුස්තකාල සේවා මණ්ඩලයේ මුද්‍රිත ප්‍රකාශනයන් සඳහා යොදා ගැනීමේ අයිතිය ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය යනුවෙන් ප්‍රකාශ කිරීමේ අයිතිය ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය වෙතද හිමි වේ.

★ නිර්මාණ අංශයක් සඳහා හෝ අංශ කිහිපයක් සඳහා හෝ සියලුම නිර්මාණ අංශ සඳහා ඕනෑම අයෙකුට නිර්මාණ ඉදිරිපත් කළ හැකිය. එනමුත් සෑම නිර්මාණයක් සඳහාම වෙන වෙනම ඉල්ලුම් පත්‍රය බැගින් අමුණා එවිය යුතුය. එසේ වුවත් එක් තරගකරුවෙක් හට එක් තරග අංශයක් සඳහා ඉදිරිපත් කළ හැකි උපරිම නිර්මාණ සංඛ්‍යාව 01 කි. නිර්මාණ වල කිසිදු ස්ථානයක නිර්මාණකරුගේ විස්තර සඳහන් නොකළ යුතුය.

★ පාසල් අංශයේ නිර්මාණ විදුහල්පතිතුමා / පුස්තකාලයාධිපතිතුමා මගින් එම ශිෂ්‍යයාගේම නිර්මාණයක් බවට සහතික කර ඉදිරිපත් කළ යුතුය.

★ සියලුම ලිඛිත නිර්මාණ A4 ප්‍රමාණයේ කඩදාසි වල තනි පැත්තේ පැහැදිලිව අත් අකුරින් හෝ යතුරු ලියනය කර හෝ පරිගණක යතුරු ලියනය කර තිබීම සුදුසුය. කඩදාසියේ වම්පස තීරුව අඟල් එක හමාරක ප්‍රමාණයක් ඉඩහල යුතු අතර ලකුණු යෙදීම සහ නිර්මාණ අංකනය කිරීම සඳහා කඩදාසියේ ඉහළ තීරුව හා පහළ තීරුවේ අඟල් එකක පමණ ප්‍රමාණයක් ඉඩ තැබිය යුතුය. සෑම පිටුවක්ම පිළිවෙලින් අංකනය කර තිබිය යුතුය.

★ සියලු නිර්මාණ ස්වතන්ත්‍ර නිර්මාණ විය යුතුය. වෙනත් නිර්මාණ කරුවන්ගේ නිර්මාණ උපුටා ගැනීම, කොටස් උපුටා ගැනීම සිදු නොකළ යුතුය. <u>**මීට ඉහත වර්ෂයන්හි ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය උළෙල සඳහා ඉදිරිපත් කළ නිර්මාණ හෝ වෙනත් සාහිත්‍ය තරග සඳහා ඉදිරිපත් කර ජයග්‍රහණය කර ඇති නිර්මාණද ඉදිරිපත් නොකළ යුතුය. වසර 02 ක් තුළ එකම නිර්මාණ අංශයකින් ප්‍රථම ස්ථානය දිනාගෙන ඇත්නම් මෙම වසර සඳහා වෙනත් නිර්මාණ අංශයකින් තරග කල හැකිය**</u>.

★ ඉහත සෑම අංශයක් සඳහාම සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් වෙන වෙනම තරග පවත්වනු ලැබේ. නමුත් ප්‍රමාණවත් නිර්මාණ සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී හෝ ප්‍රශස්ත නිර්මාණ ඉදිරිපත්ව නොමැති අවස්ථාවන්හිදී එම නිර්මාණ ඇගයීම හා තරගයට අදාල කර ගැනීම සම්බන්ධයෙන් මෙන්ම ඒ හා අදාලව දෙනු ලබන තීරණයන්හි සහ ගනු ලබන තීරණ වලදී විනිශ්චය මණ්ඩලයේ සභාපතිගේ තීරණය හා ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ අවසාන තීරණය වේ.

★ තරග විනිශ්චය ඒ පිළිබඳ ජාතික මට්ටමේ සම්මානලාභී ප්‍රවීන කලාකරුවන්ගෙන් හා විශ්වවිද්‍යාල ආචාර්යයවරුන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් විසින් අදියරයන් දෙකකින් සිදුකරනු ලැබේ.

★ ඉදිරිපත් වන නිර්මාණ පළාත් මට්ටමේ ඇගයීමකට ලක් කිරීමට තරම් ප්‍රශස්ථ මට්ටමක නොපවතින බව ඇගැයුම්කරුවන් විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවකදී, යම් අංශයක සම්මාන සහතික පත් ප්‍රදානය නොකර සිටීම, කුසලතා සහතික ප්‍රදානය කිරීම සහ අවසාන තීරණ ගැනීමේ සම්පූර්ණ අයිතිය තරග විනිශ්චය මණ්ඩලය සතුවේ.

<u>**තරග අංශ සඳහා වන අමතර විස්තර හා කොන්දේසි**</u>

- සියලුම තරග සඳහා අභිමත මාතෘකාවකින් නිර්මාණ ඉදිරිපත් කළ හැක. සියලුම නිර්මාණ 2025 ජූලි මස 31 දිනෙන් පසුව ප්‍රකාශයට පත්කරන ලද වෙනත් තරග සඳහා ඉදිරිපත් කර ජයග්‍රහණය නොකරන ලද නිර්මාණයක් විය යුතුය.
- ගීත, කෙටිකතා,කාව්‍ය, නවකතා ආදියේ දී සාමාන්‍ය කෘතියක අඩංගු පෙරවදන, පටුන ආදිය ද තිබිය යුතුය.

**01. කාව්‍ය රචනා -**

සඳැස් කාව්‍ය හෝ නිසැඳැස් කාව්‍ය යන ඕනෑම ආකාරයක කාව්‍ය රචනා ඉදිරිපත් කළ හැක.

සඳැස් - උපරිම කාව්‍ය සංඛ්‍යාව 15 වේ. නිසඳැස් - උපරිම පේළි සංඛ්‍යාව 50 වේ. (කාව්‍ය සංග්‍රහ ලෙස ඉදිරිපත් කරන්නේ නම් රචකයාගේ අභිමතයෙන් එයින් කාව්‍ය 05 ක් තෝරා දැක්විය යුතුය.

විවෘත අංශය-සඳැස් නිර්මාණයන්හි කාව්‍ය සංග්‍රහයක් ලෙස ඉදිරිපත් කළ යුතු අතර කාව්‍ය තේමාවන් අවම10 ක් 15 ක් අතර විය යුතුය.

**02. ගීත රචනා -**

දළ වශයෙන් විනාඩි 03 පමණ කාලයක් ඇතුලත ගායනා කළ හැකි ගීතයකට උචිත පද මාලාවක් විය යුතුය.

පාසල් අංශය - උපරිම පද පේළි සංඛ්‍යාව 15 ත් 20ත් අතර විය යුතුය.

විවෘත අංශය - ගීත රචනා සංග්‍රහයක් ලෙස ඉදිරිපත් කළ යුතුය. අඩංගු ගීත සංඛ්‍යාව 10 ත් 15ත් අතර විය යුතුය.

**03. කෙටි කතා -**

පාසල් අංශය - දළ වශයෙන් වචන 750 - 1200 ක අතර ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතුය.

විවෘත අංශය - දළ වශයෙන් වචන 1500 - 2000 ක අතර ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතුය. (කෙටිකතා 5-7දක්වා පමණ අන්තර්ගත වු කෙටිකතා සංග්‍රහයක් ලෙස ඉදිරිපත් කළ යුතුය.)

**04. විද්‍යා ප්‍රබන්ධ -**

පාසල් අංශය සඳහා - දළ වශයෙන් වචන 750 - 1200 ක අතර විද්‍යා ප්‍රබන්ධ නිර්මාණයක් විය යුතුය.

විවෘත අංශය - දළ වශයෙන් වචන 1250 - 2000 ක අතර විද්‍යා ප්‍රබන්ධ නිර්මාණයක් විය යුතුය.(විද්‍යා ප්‍රබන්ද 5ක් පමණ අන්තර්ගත වු විද්‍යා ප්‍රබන්ද සංග්‍රහයක් විය යුතුය)

- විද්‍යා සංකල්ප විද්‍යාත්මක මූලධර්ම ඇතුළත් වූ ප්‍රබන්ධයක් විය යුතුය.
- මෙම තරග අංශයට විද්‍යා කෙටි කතා සහ විද්‍යා නවකතා අදාල කර ගැනේ.

**05. නවකතා හා නවකතා අත්පිටපත් -**

2025 ජූලි මස 31 දිනෙන් පසුව ප්‍රකාශයට පත්කල හෝ මුද්‍රණයට සකස් කර තිබෙන සාහිත්‍ය නිර්මාණ ඉදිරිපත් කළ යුතු වේ.ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය උළෙල සඳහා මීට පෙර ඉදිරිපත් කර තිබූ නිර්මාණ මෙම තරගය සඳහා ඉදිරිපත් නොකළ යුතුය.

**06. කෙටි නාට්‍ය අත්පිටපත් -**

**පාසල් අංශයේ** - වේදිකා ගත කිරීමේ කාලය විනාඩි 15-20 අතර විය යුතු බැවින් එම කාල පරාසය තුළ රංග ගත කළ හැකි පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

**විවෘත අංශය** - වේදිකා ගත කිරීමේ කාලය විනාඩි 20-25 අතර විය යුතු බැවින් එම කාල පරාසය තුළ රංග ගත කළ හැකි පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එය පොදු ජන වේදිකාවකදි වේදිකාගත කළ හැකි මට්ටමේ භාෂාවකින් ලියැවී තිබිය යුතු අතර ආගමික, ජාතික හෝ සමාජ විරෝධතාවයන් කුළුගැන්වෙන ආකාරයේ කථා තේමාවක් ඇතුළත් නිර්මාණයක් නොවිය යුතුය. **(කෙටි නාට්‍යයේ තේමාව සැකෙවින් හා පාත්‍ර වර්ගයා ආදිය දැක්විය යුතුය.)**

**07. පරිවර්තන -**

2025 ජූලි මස 31 දිනෙන් පසුව ප්‍රකාශයට පත්කල හෝ මුද්‍රණයට සකස් කර තිබෙන සාහිත්‍ය, කලා හෝ ඊට සම්බන්ධිත කෘතියක් / පිටු 20 කට නොඅඩු ලේඛන අත් පිටපත් ( වචන 2500 ක අවමයක් අන්තර්ගත විය යුතුය ) ඉදිරිපත් කළ යුතු වේ.

අත් පිටපත් යතුරු ලියනය කර තිබෙන හෝ ඉතා පැහැදිලි අත් අකුරින් යුතු විය යුතු අතර, මෙම තරගය සඳහා වෙනත් සම්මාන උළෙල සඳහා ඉදිරිපත් කර සම්මාන දිනූ නිර්මාණ සහ ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය උළෙල සඳහා ඉදිරිපත් කර සම්මාන නොලැබූ නිර්මාණද ඉදිරිපත් නොකළ යුතුය.

- පරිවර්තනය සඳහා අදාල කරගත් මුල් කෘතියේ ඡායා පිටපතක්ද ඉදිරිපත් කළ යුතුය. නොඑසේනම් මුල් කෘතිය නැවත භාර දෙනතුරු නිර්මාණය සමඟ ඉදිරිපත් කළ යුතුය.

**08. චිත්‍ර - ( පාසල් අංශය සඳහා පමණි)**

තරග අංශ 02 කි. 06 ශ්‍රේණියේ සිට 08 ශ්‍රේණිය දක්වා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහාත් ,09 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහාත් පැවැත්වේ. කියවූ සාහිත්‍ය කෘතියක යම් සිදුවීමක් හෝ අවස්ථාවක් අදාල කරගත් වර්ණ ගැන්වූ නිර්මාණයක් විය යුතුය. අදාල කෘතිය හා අවස්ථාව සම්බන්ධව කෙටි විස්තරයක් අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුය. වෙනත් කෘතීන්ගෙන් පොත් වලින් හා ස්ථාන වලින් කොපි කරන ලද චිත්‍ර ඉදිරිපත් කිරීමෙන් වළකින්න. එවැනි චිත්‍ර වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රමාණය - ( A 3 ප්‍රමාණයේ කඩදාසියක අභිමත වර්ණ මාධ්‍යකින් )

**09. සාහිත්‍ය පිළිබඳ ශාස්ත්‍රීය ග්‍රන්ථ-** පුස්තකාල විද්‍යාව කියවීම සාහිත්‍ය හා කලාවන්ට අදාල ඉහත අංශයන්ට අයත් නොවන වෙනත් විවිධ විෂයන්ට අදාල නිර්මාණාත්මක හා පර්යේෂණාත්මක කෘති හා අත්පිටපත් මෙන්ම යම් විෂයයක් අළලා කෙරුණු ශාස්ත්‍රීය නිබන්ධන මෙහිදී කෘතියේ විෂය සම්බන්ධව සුවිශේෂී කරුණු ඉදිරිපත් වීම මෙන්ම එහි භාෂා භාවිතයේ හා සාහිත්‍යමය අංශය සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ඇත.

**10. ළමා කතා -** අවුරුදු 05 සහ 12 අතර වයස් කාණ්ඩයේ ළමුන්ට ගෝචර වන පරිදි අදාල වන ස්වාධීන තේමාවකින් යුත් නිර්මාණයක් විය යුතුය. ඡායාරූප හෝ චිත්‍ර සටහන් ඉදිරිපත් කරන අවස්ථාවන්හිදී ඒ සඳහා අදාල වන එම රූප සටහන්ද සමගම කෘතිය ඉදිරිපත් කළ යුතුය.

- 2025 ජූලි මස 31 දිනෙන් පසුව ප්‍රකාශයට පත්කල මුද්‍රණයට සකස් කර තිබෙන අත් පිටපත්ද ( යතුරු ලියනය කර තිබෙන හෝ පැහැදිලි අත් අකුරින් ලියන ලද ) ඉදිරිපත් කළ හැකි අතර වෙනත් සාහිත්‍ය තරග හෝ උළෙල නියෝජනය කර ජයග්‍රහණ ලැබූ නිර්මාණ ඉදිරිපත් නොකළ යුතුය.

**11. ඡායාරූප** - 9-13 ශ්‍රේණිවල ළමා අංශ වල නිර්මාණකරුවන්ට හා විවෘත අංශයේ නිර්මාණකරුවන්ට ඉදිරිපත් විය හැකිය. මෙහි අංශ දෙකකි. ජංගම දුරකතන මගින් හා වෘත්තීය කැමරා මගින්

- **වෘත්තීය කැමරා මගින්-** ඡායාරූපයේ ප්‍රමාණය A3 සිරස් අතට හෝ තිරස් අතට විය යුතුය. ඡායාරූපය සංස්කරණය කළ නොහැක.

පහත සඳහන් තේමාවන් යටතේ ඡායාරූප ඉදිරිපත් කළ යුතුය.

1. වනජීවීන්, සොබාදහම, මිනිස් ජීවිතය, මනුෂ්‍යත්වය, සංස්කෘතිය සහ උරුමය ආදි ගතිලක්ෂණ විද්‍යාමාන වන්නා වූ මුද්‍රිත ඡායාරූපයක් විය යුතුය. මෙම තේමාවන් යටතේ ඌව පළාත තුළ ස්ථාන සහ සිද්ධි වලට අදාලව ඡායාරූප සිදු කළ යුතුයි.

## ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය තරගාවලිය - **2026**

### පාසල් අංශයේ ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | S | | | |

සෑම නිර්මාණයක් සඳහා වෙන වෙනම අයදුම්පතක් බැගින් ඉදිරිපත් කරන්න

- නිර්මාණ අංශය — කාව්‍ය ☐ ගීත ☐ කෙටිකතා ☐ විද්‍යා ප්‍රබන්ධ ☐
  චිත්‍ර ☐ කෙටි නාට්‍ය ☐
  ඡායාරූප — වෘත්තීය කැමරා මඟින් ☐ (☑ ලකුණ යොදන්න)
- නිර්මාණයට යොදන නම - ------------------------------------------------

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ------------------------------------------------
------------------------------------------------

මුලකුරු සමග නම ( ඉංග්‍රිසි කැපිටල් අකුරින් ) } ------------------------------------------------
❖ පරිගණක ගත කිරීමේ පහසුව පිණිසය } ------------------------------------------------

02. ස්ත්‍රී පුරුෂ භාවය - ස්ත්‍රී ☐ පුරුෂ ☐ (☑ ලකුණ යොදන්න)

03. පාසලේ නම හා ලිපිනය : ------------------------------------------------
------------------------------------------------

04. පෞද්ගලික ලිපිනය : ------------------------------------------------
------------------------------------------------

05. දිස්ත්‍රික්කය : බදුල්ල ☐ මොණරාගල ☐ (☑ ලකුණ යොදන්න)

06. දුරකථන අංකය : පාසල ☐☐☐☐☐☐☐☐☐☐
පෞද්ගලික / නිවස ☐☐☐☐☐☐☐☐☐☐

07. ඉගෙනුම ලබන ශ්‍රේණිය :

| 06 | 07 | 08 | 09 | 10 | 11 | 12 | 13 |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

(☑ ලකුණ යොදන්න)

08. භාෂා මාධ්‍ය : සිංහල ☐ දෙමළ ☐ (☑ ලකුණ යොදන්න)

09. ඉහත නම් සඳහන් මා විසින් ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය තරගය සඳහා මෙම අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කරනු ලබන නිර්මාණය මාගේ ස්වතන්ත්‍ර නිර්මාණයක් බවටද මීට ප්‍රථම කිසිදු සාහිත්‍ය උළෙලකට හෝ තරගයකට ඉදිරිපත් නොකල නිර්මාණයක් බවටද, තරගයේ කොන්දේසි නීතිරීති වලට අනුකූලව නිර්මාණය ඉදිරිපත් කරන බවටද, එමෙන්ම විනිශ්චය මණ්ඩලයේ තීරණයන්ට එකඟ වන බවටත්, මෙයින් සහතික කරමි.

---------------------- දිනය ---------------------- ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ අත්සන

10. **ශිෂ්‍යයාගේම නිර්මාණයක් බවට විදුහල්පතිතුමාගේ /අංශ ප්‍රධානියාගේ සහතිකය**

ඉහත නම සඳහන් ශිෂ්‍යයා/ ශිෂ්‍යාව මෙම පාසලේ ________________ ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත් ඔහු / ඇය විසින් ඉදිරිපත් කරන මෙම නිර්මාණය ඔහුගේ/ඇයගේ නිර්මාණයක් බවට සහතික කරමි.

---------------------- දිනය ---------------------- නිල මුද්‍රාව ---------------------- විදුහල්පති / පුස්තකාලයාධිපති

කවරයේ වම්පස ඉහළ කෙළවර "ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය උළෙල - 2026 " ලෙස සඳහන් කළ යුතුය.
2026 මැයි 15 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නිර්මාණ ඉදිරිපත් කල යුතු ලිපිනය
**අධ්‍යක්ෂ, ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය, රේස්කෝස් පාර, බදුල්ල - කාර්යාලය 055 -2222204**

## ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය තරගාවලිය - **2026**

### විවෘත අංශයේ ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | | | | |

සෑම නිර්මාණයක් සඳහා වෙන වෙනම අයදුම්පතක් බැගින් ඉදිරිපත් කරන්න

- නිර්මාණ අංශය - කාව්‍ය ☐ ගීත ☐ කෙටිකතා ☐ කෙටි නාට්‍ය ☐
  නවකතා ☐ පරිවර්තන ☐ විද්‍යා ප්‍රබන්ධ ☐ සාහිත්‍ය පිළිබඳ ☐
  ළමා කතා ☐ ඡායාරූප ☐ ශාස්ත්‍රීය ග්‍රන්ථ ☐
  (☑ ලකුණ යොදන්න)
- නිර්මාණයට යොදන ලද නම- ------------------------------------------------

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම - පූජ්‍ය /මයා/මිය/මෙනවිය ------------------------------------------------
------------------------------------------------

මුලකුරු සමග නම ( ඉංග්‍රිසි කැපිටල් අකුරින් ) } ------------------------------------------------
❖ පරිගණක ගත කිරීමේ පහසුව පිණිසය } ------------------------------------------------

02. පෞද්ගලික ලිපිනය - ------------------------------------------------
------------------------------------------------
විද්‍යුත් ලිපිනය ( E-mail ) ------------------------------------------------

03. ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐ (☑ ලකුණ යොදන්න)

04. දිස්ත්‍රික්කය : බදුල්ල ☐ මොණරාගල ☐ (☑ ලකුණ යොදන්න)

05. දුරකථන අංක : නිවස ☐☐☐☐☐☐☐☐☐☐
ජංගම /පෞද්ගලික ☐☐☐☐☐☐☐☐☐☐
☐☐☐☐☐☐☐☐☐☐

06. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

07. භාෂා මාධ්‍ය : සිංහල ☐ දෙමළ ☐ (☑ ලකුණ යොදන්න)

08. ඉහත නම් සඳහන් මා විසින් ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය තරගය සඳහා මෙම අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කරනු ලබන නිර්මාණය මාගේ ස්වතන්ත්‍ර නිර්මාණයක් බවටද, තරගයේ කොන්දේසි, නීතිරීති වලට අනුකූලව මෙම නිර්මාණය ඉදිරිපත් කරන බවටද මෙන්ම විනිශ්චයේ මණ්ඩලයේ තීරණයන්ට එකඟ වන බවටත් මෙයින් සහතික වෙමි.

---------------------- දිනය ---------------------- අයදුම්කරුගේ අත්සන

කවරයේ වම්පස ඉහළ කෙළවර "ඌව පළාත් රාජ්‍ය සාහිත්‍ය උළෙල - 2026" ලෙස සඳහන් කළ යුතුය.
2026 මැයි 15 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නිර්මාණ ඉදිරිපත් කල යුතු ලිපිනය
**අධ්‍යක්ෂ, ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය, රේස්කෝස් පාර, බදුල්ල - කාර්යාලය 055 -2222204**